# An Investigative Study of the 'Soul Concept' in the *Sānkhya, Yōga* and *Vaisheshika* Philosophies

සාංඛ්‍යල යෝග හා වෛශේෂික දර්ශනයන් තුළ දැක්වෙන ආත්ම සංකල්පය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

Karapikkada Sobitha

කරපික්කඩ සෝභිත හිමි

වේද, උපනිෂද් චින්තකයන්ගේ මූල බීජ රැගෙන නිර්මාණය වූ ඉතා පැරණි දාර්ශනික සම්ප්‍රදායන් දෙකක් ලෙස ප්‍රකට සාංඛ්‍ය දර්ශනය හා වෛශේෂික දර්ශනයන් තුළ අන්තර්ගත ඉගැන්වීම් පිළිබඳ විමසා බැලීමේ දී එහි භෞතිකත්වයෙන් තොරවූ පදාර්ථයක් පිළිබඳ මූලික වශයෙන් කරුණු දක්වා ඇති අයුරු පෙනේ. මෙහි දී කපිල නම් ඍෂිවරයා විසින් නිර්මාණය කරන ලද දර්ශනය සාංඛ්‍ය යෝග දර්ශනයයි. එහි දැක්වෙන **සාංඛ්‍යපවචන සූත්‍රය** නම් ග්‍රන්ථය මෙම සම්ප්‍රදායේ මූල ග්‍රන්ථය ලෙස සඳහන් වෙයි.

මෙම සූත්‍රයේ දැක්වෙන ආකාරයට සාංඛ්‍යයෝ ලෝකය පිළිබඳ දක්නට ලැබෙන මූලික ලක්ෂණ දෙකක් පිළිබඳ අවධාරණය කොට ඇත. එනම්,

01. ප්‍රකෘති
02. පුරුෂ

මෙම මූලික ලක්ෂණ දෙක පදනම් කොටගෙන ලොව සියල්ල විග්‍රහ කළ හැකි බව මොවුන්ගේ විශ්වාසයයි.

විශ්ව පරිණාමයේ මූල හේතුව ලෙස සාංඛ්‍යයෝ ප්‍රකෘතිය දක්වා ඇත. "ප්‍ර" පූර්ව √කෘ ධාතුවෙන් නිර්මාණ වන්නා වූ ''ප්‍රකෘති'' පදය තුළින් ''කිරීමට'' හෝ ''වෙනස් වීමට පෙර'' යන අර්ථයන් ගෙන දෙයි. මෙයින් ඔවුන් අර්ථවත් කරනුයේ මූල පදාර්ථයයි. මෙය විග්‍රහ කිරීමේ දී සාංඛ්‍යයෝ හේතුඵල වාදය පදනම් වූ සත්කාර්යවාදය ඉදිරිපත්කොට ඇත. ''ආධ්‍යාහාරවාදය'' ලෙස ද සාංඛ්‍ය දර්ශනයේ විග්‍රහ වන්නේ මෙයම ය. මෙම ඉගැන්වීමට අනුව යම් හේතුවක් පදනම්ව නිර්මාණය වන්නා වූ ඵලය, හේතුව තුළ ගැබ්ව පවත්නා බවත්, හේතුව තුළින් ඵලය ඇද දැක්විය හැකි බවත් පෙන්වා දෙයි. මෙහි දී නිදසුනක් ලෙස ඇටවලින් තල තෙල් ලබා ගත හැකි බව දැක්විය හැක. සාංඛ්‍යයෝ මෙහි දී ප්‍රකාශ කරනු ලබන්නේ ඵලය, හේතුව තුළ නොමැති නම්, හේතුවෙන් කෙසේ ඵලයක් නිපදවිය හැකි ද යන්නයි. මෙසේ හේතුව හා ඵලය අතර ඇති සම්බන්ධය ආධ්‍යාහාර වූවක් බව දක්වන සාංඛ්‍යයෝ ඵලය යනු අලුතින් බිහි වූවක් නොව කලින් පැවති යමක් පැහැදිලි කර දැක්වීමක් පමණක් බව සඳහන් කරයි. මෙසේ ප්‍රකෘතිය යනු සමස්ත ලෝකයේ ම මූලික හේතුව ලෙස දක්වා තිබේ. එම නිසාම එය "ප්‍රධාන" යන නමින් ද හඳුන්වා ඇත. මෙම ප්‍රකෘතිය මූලික ලක්ෂණ තුනකින් යුක්ත බව ඔවුන් දක්වති.

01. සත්ත්ව

02. රජස්

03. තමස් [1]

මෙහි ''සත්ත්ව'' ගුණයෙන් සුඛිත මුදිත පක්ෂයට නැඹුරු වූ, යහපත් වූ, ගුණයන් අර්ථවත් වේ. එය ප්‍රීත්‍යාත්මකය. ප්‍රකාශක හෙවත් අරමුණු පැහැදිලි කිරීමේ ලක්ෂණයෙන් යුක්තය. සැහැල්ලුය.

''රජස්'' යනුවෙන් දක්වෙන්නේ එක්තරා අන්දමකට අපිරිසිදු වූ ගුණාංගයක් ය. රජස් ක්‍රියාකාරී බලවේගයක් ලෙස ද දක්වේ. එය දුඃඛාත්මය. චංචලය.

''තමස්'' යන්නෙන් අදහස්කොට ඇත්තේ අන්ධකාරය යන්නයි. පුද්ගලයෙකු හා සම්බන්ධයෙන් සලකා බලන විට අලසකමයි. මෙය මිත්‍යාඥාන ස්වභාව කොට ඇත්තේය. කටයුතුවලින් වැලැක්වීමේ ලක්ෂණයන්ගෙන් යුත්කය. සැහැල්ලු භාවයෙන් තොරය.

ලෝකයේ පවත්නා සෑම දෙයක් ම මෙකී ලක්ෂණයන්ට ඇතුළත් කළ හැකි අතර, සමහර වස්තූන්ගේ සත්ත්ව ගුණය වැඩි වශයෙන් ද, සමහරක් හි රජස් ගුණය ද, සමහරක් හි තමස් ගුණය ද වැඩි වශයෙන් අන්තර්ගතව ඇති බව සඳහන් වේ. මෙහි දී ප්‍රකෘතිගේ ස්වභාවය මෙන්ම සත්භාව විෂද කිරීම සඳහා සාංඛ්‍යයෝ තර්ක කිහිපයක් උපයෝගී කොටගෙන ඇත.

**01. භෙදානං පරිමාණාත්**

මහත් තත්ත්වාදීන්ගේ පරිච්ඡින්න (සීමිත බව) අව්‍යක්තයෙන් ම ව්‍යක්තය වන බවට හේතුවක් විම.

**02. සමන්වයාත්**

බුද්ධි ආදී කාර්යයන්, අව්‍යක්තය ම කාරණාකොට ඇති බවට ඔවුන්ගේ ම සම්බන්ධය යැයි කියන ලද සමාන රූපත්වය හේතුවක් වීම.

**03. ශක්තිතඃ ප්‍රවෘත්තේශ් ච**

කාරණයෙහි වූ ශක්තියෙන් කාර්යය වීම.

**04. කාරණකාර්ය විභාගාත්**

කාරණයෙන් ම කාර්ය ප්‍රකාශයට පත්වීම හා කාර්යයෙහි හා කාරණයෙහි වෙනසක් ඇතිවීම.

**05. අවිභාගාත් වෛශ්වරූපස්‍ය**

සියලු කාර්යයන් කාරණයෙහි ම ලීනත්වයට පත්වීම.[2]

උක්ත ප්‍රකෘති තත්ත්වය අසංඥී තත්ත්වයක් වන අතර, එයට තනිව ක්‍රියාකාරී වීමට ශක්තියක් නොමැත. එහෙයින් එයට ක්‍රියාකාරී වීම සඳහා සංඥී වූ මූල ධර්මයක් අවශ්‍යය. එය සාංඛ්‍යයෝ ''පුරුෂ'' ලෙස දක්වයි.

"පුරුෂ" යනු සංඥී මූල පදාර්ථයයි. එසේ නොමැතිනම් පුද්ගලික වූ ආත්ම ස්වරූපීය තත්ත්වයයි. පරමාර්ථමය වශයෙන් විමසා බැලීමේ දී මෙම පුරුෂ යන්න තුළින් දක්වන පෞද්ගලික ආත්ම ස්වරූපය දෙවැන්නකින් තොර වූවක් ලෙස විග්‍රහ වේ. එම නිසා,

- පුරුෂ අවිකාරීය
- විවේකීය
- ස්වතන්ත්‍රය
- චෙතනය
- ස්වභාව

වශයෙන් පසිඳුරන් අග්‍රයෙන් පුරුෂ දත නොහැකිය. මෙය සාංඛ්‍ය කාරිකාවේ,

- පුරුෂ
- අත්‍රිගුණ
- විවේකී
- චෙතන
- අප්‍රස්ව ධර්මී
- කෙවලී
- දෘෂ්ටා
- අකර්තා[3]

යන පර්යාය පදවලින් ද හඳුන්වා දී ඇත. මෙසේ සාංඛ්‍යයෝ පෙන්වා දීමට උත්සාහකොට ඇත්තේ පුරුෂ යනු වෙනස් නොවන පදාර්ථයක් බවයි. එහි දී ඔවුන් ප්‍රකෘතිය තුළ සහජ ලක්ෂණයට පරස්පර වූ ස්වභාවයක් ද, පුරුෂ පදාර්ථයෙහි සහජ ලක්ෂණයන්ගෙන් ප්‍රකට වූ ස්වභාවයක් ද ඉස්මතුකොට දක්වයි. නොවෙනස්වන්නා වූ පුරුෂ පදාර්ථයෙහි පැවැත්ම තහවුරුකොට දැක්වීම සඳහා ද සාංඛ්‍ය දර්ශනයේ තර්ක 05 ක් ඉදිරිපත්කොට ඇත.

**01. සංඝාත පරාර්ථත්වය.**

ලොව පවත්නා සියලු භෞතික වස්තු යම් යම් කොටස් එක්ව නිර්මාණය වී ඇත. සංඝාත නම් වන ඒවා අන් අයෙකුගේ ප්‍රයෝජනය පිණිස පවතී. විවිධ උපකරණයන්ගෙන් සමන්විත රථය අන් පුරුෂයෙකුගේ භාවිතය පිණිස පවත්නාක් මෙනි. එසේම බුද්ධි මනස් ආදී ඉන්ද්‍රියයන්ගෙන් යුත් ශරීරය ද අන් අයකුගේ ප්‍රයෝජනය පිණිස පවතී. ඒ තැනැත්තේ ''පුරුෂ'' නම් වේ.

**02. ත්‍රිගුණාදී විපර්යත්වය**

සෑම වස්තුවක්ම සත්ත්ව, රජස්, තමස් යන ගුණත්‍රයෙන් නිර්මාණය වී ඇත. සාංඛ්‍යයන් ප්‍රකාශ කළ කරුණක් වූයේ මෙකී ලක්ෂණත්‍රය පවතින නිසාම ඉන් ඔබ්බට ගිය තත්ත්වයක් පවත්නා බව ගම්‍ය වන බවයි. එකී තත්ත්වය ''පුරුෂ'' නමින් හඳුන්වනු ලබයි.

**03. අධිෂ්ඨාතෘත්වය.**

අප ලබන නොයෙක් ආකාරයේ අනුභූතින් සියල්ල එක් රැස් කර ප්‍රත්‍යක්ෂ කිරීමට උපකාරී වන කිසියම් ජීවයම මූලධර්මයක් පැවතිය යුතු ය. එය ''පුරුෂ'' නම් වේ.

**04. භෝක්තෘත්වය.**

ලොව ඇති සියලු දේ සුඛ, දුක්ඛ, උපේක්ෂා යන ත්‍රිවිධ වින්දනයන් ලබා දේ. එම වින්දනය විඳිනුයේ ''පුරුෂ'' ය.

**05. කෛවල්‍යාර්ථී ප්‍රවෘත්තේශ්ච.[4]**

ලොව ජීවත්වන මිනිසුන් දුකින් පිරි ජීවිතයෙන් අත්මිදීමට උත්සාහ කරති. මෙයින් පෙනෙනුයේ ලෞකිකත්වයෙන් අත්මිදී ලබාගත යුතු යමක් ඇති බවයි. ඒ ''පුරුෂ'' නම් වේ.

මෙසේ පුරුෂ තුළින් පුද්ගල ආත්ම ස්වරූපයක් සාංඛ්‍යයන් ඉදිරිපත්කොට ඇති බව පෙනේ. නමුත් මෙහිදී ඔවුන් දක්වන ආත්ම ස්වරූපය වේද සාහිත්‍යයේ නිර්මාණය වූ දේවත්වය මූලික වූ ආත්ම ස්වරූපීභාවයට සමාන වූවක් නොවන අතර, එය ස්වාදීන ස්වතන්ත්‍ර වූවක් බව පෙනේ.

## වෛශේෂික දර්ශනය.

ආත්මය පිළිබඳ තවත් සුවිශේෂී විවරණයක් වෛශේෂික දර්ශනය තුළ ද දැකගත හැකි වේ. ''වෛශේෂික'' යන පදය ''වෙනස'' යන අරුත් දෙන ''විශේෂ'' යන පදයෙන් බිඳී එන අතර, මේ ධර්මය අනුව විශ්වමූලයේ ඇත්තේ ඒකත්වය නොව නානත්වය බැවින් එය මෙසේ හඳුන්වනු ලැබ තිබේ.[5] මෙම දර්ශනය තුළ ආත්ම ස්වභාවය පිළිගෙන ඇත. එසේම ලොව සියල්ල පදාර්ථ වශයෙන් කොටස් 07ක් පෙන්වා දෙන වෛශේෂික දර්ශනයේ එහි පළමු කොටස ලෙස ''ද්‍රව්‍ය'' ද නැවත කොටස් 09ක් යටතේ බෙදීමට ලක්වෙයි.

01. පෘථිවි
02. ජල
03. අග්නි

04. වායු

05. ආකාශ

06. කාල

07. දිශා

08. ආත්ම

09. මනස් [6]

මෙහි මූලික පදාර්ථ 05 මහාභූත රූපයන්ට ඇතුලත්වන අතර අනෙකුත් පදාර්ථයෝ සර්වව්‍යාපී, අභෞතික පදාර්ථයෝ ය. මෙම ඉගැන්වීමේ දක්වෙන ''ආත්ම'' පදාර්ථය තුළ

01. බුද්ධි

02. සුඛ

03. දුඃඛ

04. ඉච්ඡා

05. ද්වේශ

06. ප්‍රයත්න

07. ධර්ම

08. අධර්ම

09. සංස්කාර යන විශේෂ ගුණ 09 ක් ද

01. සංඛ්‍යා

02. පරිමාණ

03. පෘථක්ත්ව

04. සංයෝග

05. විභාග

යන සාමාන්‍ය ගුණ 05 ක් ද ඇතුලත් බව දක්වේ.[7] පුද්ගලයා ඥානය හෙවත් දැනීම ලබනුයේ මෙම ආත්මය පදනම් කොටගෙනය. එසේම පුද්ගල ආශ්වාස, ප්‍රාශ්වාස, සැප දුක් ආදී සියල්ල ද මෙම ආත්මය පදනම් ව සිදු වේ. එසේ ම උක්ත පදාර්ථයන්ගේ දක්වෙන (මනස්) මනස හා ආත්මය පදාර්ථ දෙකකි. මෙහිදී මනස් ආත්මයට සැප දුක් සිදුකරන ඉන්ද්‍රිය බවට පත්වේ. ඇස ආදී ඉන්ද්‍රියන් හා ඒවාට ගොදුරුවන රූපාදී අරමුණු නිසා ආත්මයට ඒ ඒ වස්තූන් හඳුනාගැනීමට හැකියාව ලැබේ. ආත්මය සර්වව්‍යාපී නිසා හැම ඉන්ද්‍රියක් පාසාම හැම අරමුණක් කෙරෙහිම එකවිට සම්බන්ධ වීමට පුළුවන[8]. මෙම ඉගැන්වීමට අනුව වෛශේෂික දර්ශනයේ ''ආත්මය'' දුක්ඛයක් ලෙස දක්වා ඇත. එසේ ම ආත්මයේ ප්‍රභේද 02 ක් පසුකාලීනව වෛශේෂික දර්ශනයේ දක්වේ.

01. ජීවාත්මය

02. පරමාත්මය

මෙහි ජීවාත්මය යනු උක්ත සුඛ, දුඃඛ දෙකෙන් සමන්විත වූ ආත්මය වන අතර පරමාත්මය යනු ලෝක නිර්මාපක ස්වරූපයයි.

මේ ආකාරයෙන් වූ සාංඛ්‍යයන්ගේ හා වෛශේෂිකයන්ගේ මෙම ආත්මවාදී ඉගැන්වීම පසුකාලීනව ආත්මවාදයක් හෝ විඥානවාදයක් දක්වා සංවර්ධනය වන්නට ඇතැයි සිතිය හැක.

---

1 සුමනවංශ හිමි. නෙලුවේ, කඨෝපනිෂදය සාංඛ්‍ය දර්ශනය හා බුදු සමය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 121 පිට.

2 සාංඛ්‍ය කාරිකා, 15.

3 සුමනවංශ හිමි. නෙලුවේ, කඨෝපනිෂදය සාංඛ්‍ය දර්ශනය හා බුදු සමය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 126 පිට.

4 සාංඛ්‍ය කාරිකා, 17.

5 හිරියන්න. ඇම්. සංක්ෂිප්ත ඉන්දීය දර්ශනය, 1970, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව. 209 පිට.

6 ධම්මරතන හිමි. නාරාවිල. 1969. භාරතීය දර්ශනය, 168 පිට.

7 සුමනවංශ හිමි. නෙලුවේ, කඨෝපනිෂදය සාංඛ්‍ය දර්ශනය හා බුදු සමය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 159 පිට.

8 එම 160 පිට.